**ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් මූල්‍ය නොවන වත්කම් වල අන්තර්ගත වූ ඉඩම් හා ගොඩනැගිලි පිළිවෙලින් රු.10,002,369,340 ක් සහ රු.800,000,000 ක් ලෙස 2013 වර්ෂයේ සිදු කළ තක්සේරු වාර්තාවක් පදනම් කරගනිමින් ගිණුම්ගත කර තිබුණි. මෙම දේපළ වල පිරිවැය තක්සේරු කර වර්ෂ 09 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, රජයේ මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම් තක්සේරු කිරීම සඳහා වන 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ ප්‍රකාරව එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | කොළඹ ජාතික කෞතුකාගාරය පිහිටි ඉඩම 2022.03.29 දින මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගනු ලැබීය. මෙම ඉඩම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2022.03.30 දින යොමු කර ඇත. ඒ සඳහා ගොඩනැගිලිවල අනුමත සැලසුම් ඉල්ලා ඇති බැවින්, එම සැලසුම්වල පිටපත් ලබාදෙන ලෙස කොළඹ නගර සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී. එම සැලසුම්වල පිටපත් ලබාගැනීම සඳහා රු. 100,000.00 – 80,000.00 පමණ මුදලක් වැය වන බව නගර සභාව දන්වා ඇත. ඒ සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමෙන් පසු ඉදිරි කටයුතු කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල හා ඉඩම වර්තමාන මිල විචලනයන්ට අනුව නැවත ගණනය කර නව තක්සේරු වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් ප්‍රාදේශීය කෞතුකාගාර වන පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය හා මාගම්පුර රුහුණු කෞතුකාගාරය සම්බන්ධයෙන් වූ ඉඩම් පවරා ගැනීමේ කටයුතු විගණිත දිනය වන විට අවසන් කර තිබූ නමුත්, ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඕලන්ද යුග කෞතුකාගාරය පිහිටි භූමිය මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරීමට අදාළ අනුමැතිය කඩිනමින් කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදෙන ලෙස ඉඩම් කොමසාරිස් කාර්යාලය වෙත යොමු කර පැවති අතර, පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය පිහිටි බිම් කොටස තක්සේරු කර දෙන ලෙස 2021 වර්ෂයේ සිට අවස්ථා කිහිපයකදී තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර පැවති නමුත්, මෙතෙක් කාර්යය ඉටු කර නොමැති බවත්, 1941 ජාතික කෞතුකාගාර පනත ප්‍රකාරව දේපළ පරිහරණය කිරීමේ අයිතිය පමණක් මහනුවර කෞතුකාගරය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට ලබාදී ඇති බවත්, රුහුණු උරුම කෞතුකාගාරය පිහිටි බිම් කොටස තක්සේරු කර දෙන ලෙස සමාලෝචිත වර්ෂයේ අවස්ථා 04 කදී ලිපි මඟින් තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. | මහනුවර කෞතුකාගාරය පිහිටි දේපළ හැර අනෙකුත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර, දේපළ පවරා ගැනීමෙන් අනතුරුව පිරිවැය ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා | අභ්‍යන්තර පාලන පද්ධතීන් පිළිබඳව වරින් වර සමාලෝචනයන් සිදුකර ඇත. ඉදිරියේදී වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට නියමිතය. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් කෞතුක භාණ්ඩ එකතු කිරීමේ කළමනාකරණ ප්‍රතිපත්තියක් 2022 දෙසැම්බර් මස දක්වාත් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සම්පාදනය කර නොතිබුණි. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ඇති සමස්ථ කෞතුකාගාර පද්ධතියම නියාමනය කිරීමේ අධිකාරී බලය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි පවත්නා නීතියට අදාළ සංශෝධනයන් කර කෞතුකාගාර ක්ෂේත්‍රයේ නියාමන බලය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට ක්‍රියා කර නොතිබුණි. | කෞතුක භාණ්ඩ එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් කමිටුවක් පත්කර ඇත. එම කමිටුව විසින් අදාල ප්‍රතිපත්තියේ කොටසක් සකස් කර අවසන්ව ඇත. | කෞතුක භාණ්ඩ එක් රැස් කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කළ යුතු අතර කෞතුකාගාර පද්ධතිය නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලය වෙනුවෙන් ගිනි ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2021 ජනවාරි 01 දින රු.98,550,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ මෙම ව්‍යාපෘතියක් ආරම්භ කර තිබූ අතර, 2022 මාර්තු 31 දින එහි වැඩ අවසන් කිරීමට නියමිතව පැවතිණි. නමුත්, 2022 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘතියෙහි සමස්ථ භෞතික කාර්යසාධනය සියයට 35 ක් වූ අතර, එදිනට මූල්‍ය වියදම රු.28,579,655 ක් විය. 2023 අප්‍රේල් 04 දින දක්වා මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි. | 2023 අප්‍රේල් 30 දිනට පෙර මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කරන ලෙස DIMO ආයතනය වෙත (කොන්ත්‍රාත්කරුට) දැනුම් දී ඇත. | ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ඉටු කර ප්‍රශස්ථ කාර්ය සාධන මට්ටම තහවුරු කිරීමට ඉහළ කළමනාකරණය වගබලා ගත යුතු බව. |

### 3.3 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකට සකස් කිරීම පිළිබඳ උපදෙස් ලබාදුන් මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ අංක PED/e-GP/Circular/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති චක්‍රලේඛයට සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක PED/e-GP/Circular/2018 හා 2018 ඔක්තෝම්බර් 23 දිනැති චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | එම චක්‍රලේඛ ප්‍රකාරව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව තුළ සම්බන්ධතා නිලධාරියෙකු (Liaison Officer) ලෙස පත් කළ හැකි, රාජ්‍ය සේවයේ ප්‍රසම්පාදන දැනුම, ප්‍රමාණාත්මක ඇගයීම් හා සැලකිය යුතු අත්දැකීම් සහිත තොරතුරු හා තාක්ෂණවේදය සම්බන්ධව දැනුම ඇති මාණ්ඩලික නිලධාරියෙකු දැනට නොමැති බැවින්, මෙම චක්‍රලේඛය මෙම දෙපාර්තමේන්තුව තුළ තවම ක්‍රියාත්මක කර නැත. එවැනි නිලධාරියෙකු පැමිණි විගස පත් කිරීම සිදු කොට විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමයට **(e-GP)** අනුගතව කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව දන්වා සිටිමි | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියා කළ යුතු බව. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරය දිගුකාලයක සිට දෛනිකව භාවිතයට නොගැනීම හේතුවෙන් නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය. | කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ශ්‍රවණාගාරය කොවිඩ් වසංගත කාලය තුළ භාවිතය අවම වුවද මේ වනවිට දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහාත්, බාහිර පාර්ශවයන්ගේ ඉල්ලීම් සඳහාත් භාවිතයට ගනී. | දෙපාර්තමේන්තුව සතු වත්කම් ඌන උපයෝජිතතාවයෙන් තොරව භාවිතා කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ ජෛව විද්‍යා මැදිරියට යාබදව පවතින දෙවන මහලේ වම් පස කොටස මුළුමනින්ම වසා දමා ඇති අතර, 2012 වසරේ සිටම මෙම කොටස මහජන ප්‍රදර්ශනයෙන් ඉවත් කර තිබුණි. මෙම කොටස සඳහා සුදුසු අළුත්වැඩියාවන් සිදු කර මහජන ප්‍රදර්ශනය සඳහා කඩිනමින් විවෘත කිරීමේ හෝ ඵලදායී කාර්යයකට මෙම නිශ්කාර්යා කොටස භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ මැදිරි නවීකරණ කටයුතු සඳහා ප්‍රධාන සැලැස්මක් (Master Plan) සකස් කර 2016 වර්ෂයේ සිට එම සැලැස්මට අනුව කොටසින් කොටස නවීකරණය කරනු ලබයි. එය ලැබෙන ප්‍රතිපාදන සහ සිටින තාක්ෂණික ශිල්පීන් ප්‍රමාණය අනුව සිදුකරගෙන යමින් පවතී. | වසර 07 ක පමණ සිට සිදුකරනු ලබන මෙම කාර්යය භාරයේ ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන හා අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබාගෙන කාර්යය නිම කළ යුතු බව. |

## 3.5 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 මාර්තු 07 දින ජීවිතක්ෂයට පත් වූ නැඳුන්ගමුවේ විජය රාජා හස්තියාගේ සිරුර සංරක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කටයුතු ආරම්භ කර තිබුණි. චර්මය සැකසීමේ මූලික කාර්යයන් සඳහා ශ්‍රී | නැඳුන්ගමුවේ විජයරාජා හස්තියාගේ සිරුර සංරක්ෂණය කිරීම සඳහා සුදුසු ස්ථානය ලෙස හඳුනාගෙන ඇත්තේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අයත් ලක්සල ආයතනයට බදු | විජය රාජා හස්තියාගේ සිරුර නැවත ප්‍රතිනිර්මාණය කර මහජන ප්‍රදර්ශනය සඳහා තැබීමට සුදුසු ස්ථානයක් කඩිනමින් තීරණය කළ යුතු බව හා |

| | | | |
|---|---|---|---|
| | දළදා මාළිගාව විසින් රු.375,530 ක්ද, දෙපාර්තමේන්තුව විසින් රු.284,833 ක්ද වැය කර තිබූ අතර, මේ සම්බන්ධයෙන් වන දෙපාර්තමේන්තු වියදම් සඳහා ශ්‍රී දළදා මාළිගාව විසින් රු.1,182,453 ක මුදලක් ලබාදී තිබුණි. 2022 මාර්තු 16 දින හස්තියාගේ මෘත දේහයෙන් ඉවත් කළ චර්මය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් අධිශීතකරණයක තැන්පත් කර තිබීම හා ඉදිරි සංරක්ෂණ කටයුතු සඳහා හස්තියා තිර කිරීමට සුදුසු ස්ථානයක් කඩිනමින් තෝරා නොගැනීම මත සංරක්ෂණ කටයුතු නිසි පරිදි ඉටුකිරීම ප්‍රමාද වී තිබූ අතර, හස්ති චර්මයේ ගුණාත්මකභාවය කෙරෙහිද අවධානමක් පැවතිණි. | පදනම මත ලබාදී ඇති ගොඩනැඟිල්ලයි. ඒ අනුව ලක්සල ආයතනයට භාණ්ඩ ඉවත් කරගැනීමට දැනුම්දී ඇති අතර එම භාණ්ඩ ඉවත් කරගත් වහාම එම කටයුතු ආරම්භ කිරීමට නියමිතය. | හස්තියා ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු කඩිනම් කළ යුතු බව |
| (ආ) | දෙපාර්තමේන්තුවේ භූ විද්‍යා අංශයේ මැණික් ගල් 272 ක් ලංකා බැංකුවේ මෙට්‍රොපොලිටන් ශාඛාවේ 1964 සැප්තැම්බර් 18 දින සිට පැවති අතර, 1993 වර්ෂයේ සිදු කළ භෞතික පරීක්ෂාවේදී එයින් එක් මැණික් ගලක් කෘතිම ගලක් ලෙසට අනාවරණය වීමෙන් පසුව එම ගල භූ විද්‍යා අංශයේ තැන්පත් කර පැවතුණි. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රත්න විද්‍යාඥයෙකුගේ සහාය ලබාගෙන මෙම ඉතිරි මැණික් ගල් 271 ක ප්‍රමාණයේ වර්තමාන මූල්‍ය වටිනාකම තක්සේරු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | අදාළ මැණික් ගල් තක්සේරු කර වාර්තාවක් ලබාදෙන ලෙස මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ඉල්ලීමක් කර ඇත. | වර්තමාන මූල්‍ය වටිනාකම තක්සේරු කිරීමට සහ සමීක්ෂණයක් සිදු කිරීමට ඉහළ කළමනාකරණය කටයුතු කළ යුතු බව. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 566 ක් වුවත්, තත්‍ය කාර්ය මණ්ඩලය 361 ක් වීම නිසා එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 203 ක් විය. මෙම පුරප්පාඩු වලින් විධායක මට්ටමේ තනතුරු 16 න් තනතුරු 06 ක් සහ තෘතියික මට්ටමේ තනතුරු 05 න් 04 ක් පුරප්පාඩු වී පැවති අතර, ද්විතියික මට්ටමේ තනතුරු 103 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 90 ක්ද පුරප්පාඩු වී පැවතුණි. මෙම සේවක ඌනතාවය සමාලෝචිත වර්ෂය තුළදීද සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයින් ලබාදෙන ලෙස ඉල්ලා ඉල්ලීමක් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.<br><br>ද්විතික මට්ටමේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා අග්‍රාමාත්‍ය ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. | මෙම සේවක ඌනතා සම්පූර්ණ කර ආයතනයේ කාර්යය සාධනය ඉහළ නැංවීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | පුරප්පාඩු තුළ ඇතුළත් MN – 4 ශ්‍රේණියේ ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර දෙපාර්තමේන්තුගත තනතුරක් වූ අතර, එය වසර 10 කට වඩා කාලයක සිට පුරප්පාඩුවී පවතින, ඉතා වගකීම් සහගත කාර්යභාරයක් ඉටු කළ යුතු මෙම තනතුර සම්පූර්ණ කර ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලිඛිත අවසර ඉල්ලා සිටියද, අවසර නොලැබීම නිසා එම තනතුර තවදුරටත් පුරප්පාඩු වී පැවතුණි. | ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුර ඇතුළු MN – 4 – 2016 ගණයේ තවත් තනතුරු 05 ක පුරප්පාඩු පිරවීම සඳහා දෙපාර්තමේන්තුව අවශ්‍ය කටයුතු සිදු කළ පැවති නමුත්, අදාළ අමාත්‍යාංශ උපදෙස් හා අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලද උපදෙස් මත සුදුසු උපාධිධාරීන් අනුයුක්ත කර ගැනීම සඳහා රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් විමසුම් සිදු කරන ලෙසත් මීට අමතරව අවශ්‍ය පුරප්පාඩු පිරවීම සඳහා නැවතත් අදාළ අමාත්‍යාංශ වෙත 2023.03.30 දින ලිපි යොමු කර තිබුණි. | මෙම සේවක ඌනතා සම්පූර්ණ කර ආයතනයේ කාර්යය සාධනය ඉහළ නැංවීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | ජාතික කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ පිළිබඳ මහජන අවබෝධය ලබාදීම සඳහා ප්‍රමාණවත් පුහුණු නිලධාරීන් නොමැති වීම හා කීට විද්‍යා අංශය, සත්ත්ව විද්‍යා අංශය, උද්භිද විද්‍යා අංශය සහ භූ විද්‍යා අංශය වැනි ස්වභාවික විද්‍යා අංශ වල | දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සංවර්ධන නිලධාරීන් යොමු කරනු ලබන ආකාරය අනුව මෙම අංශ සඳහා අනුයුක්ත කිරීමට බලාපොරොත්තු වේ. | මෙම සේවක ඌනතා සම්පූර්ණ කර ආයතනයේ කාර්යය සාධනය ඉහළ නැංවීමට ක්‍රියා කළ යුතුය. |

පවතින පර්යේෂණ සඳහා යොදා ගනු ලබන කෞතුක භාණ්ඩ එකතුව නඩත්තු කිරීම, ලේඛනගත කිරීම, ගබඩා කිරීම සහ නව අයිතම රැස් කිරීම වැනි කටයුතු සඳහා ප්‍රමාණවත් සේවක පරිසක් යොදවා නොතිබීම මත එම අංශ වල කාර්යක්ෂමතාවය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය.